# සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2024

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ දිස්ත්‍රික්කයේ ප්‍රදේශීය ලේකම් කාර්යාල 11 සඳහා (මොනරාගල, මැදගම, බිබිල, මඩුල්ල, බඩල්කුඹුර, බුත්තල, වැල්ලවාය, කතරගම, සියඹලාණ්ඩුව, තණමල්විල, සෙවනගල) පහතින් සඳහන් කර ඇති පරිදි වැඩ, සැපයුම් හා සේවා ලබා ගැනීම පිණිස 2024 වර්ෂය වෙනුවෙන් ලියාපදිංචි වීමට කැමති නිෂ්පාදකයින්, සේවා සපයන්නන්, නියෝජිත ආයතනයන්ගෙන්, බෙදාහරින්නන්, ව්‍යාපාරිකයින්, සැපයුම්කරුවන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| සංකේත අංකය | සැපයුම් පිළිබඳව විස්තරය |
|---|---|
| G - 01 | ලිපි ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය. (පෑන්, පැන්සල්, ඡායාපිටපත් කඩදාසි, CD, DVD, Pen Drive සහ වෙනත්) |
| G – 02 | පරිගණක ආශ්‍රිත ලිපිද්‍රව්‍ය. (ටෝනර්, තීන්ත, මාස්ටර් රෝල් සහ පරිගණක කඩදාසි) |
| G – 03 | ඡායා පිටපත් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ඇඟිලි සලකුණු යන්ත්‍ර පරිගණක මෘදුකාංග හා දෘඩාංග, පරිගණක මුද්‍රණ යන්ත්‍ර සහ ජාලගත කිරීමේ උපාංග ආදිය. |
| G – 04 | සියලුම වර්ගවල වාහන සඳහා අමතර කොටස් හා උපාංග. |
| G – 05 | සියලුම වර්ගවල වාහන සඳහා ටයර් සහ ටියුබ්. |
| G – 06 | වාහන සඳහා බැටරි. |
| G – 07 | කාර්යාල සඳහා තිරරෙදි සවිකිරීම් හා කාපට් ඇතිරීම. |
| G – 08 | සියලුම වර්ගවල ගොඩනැගිලි හා ඉදිකිරීම් ද්‍රව්‍ය. |
| G – 09 | නිල නිවාස සහ සංචාරක නිවාස කාර්යාල සඳහා අවශ්‍ය උපකරණ හා ඉලෙක්ට්‍රොනික් උපකරණ (වානේ, ප්ලාස්ටික් හෝ ලී වලින් සාදන ලද මේස, පුටු, අල්මාරි, ලිපිගොනු රාක්ක,විදුලි පංකා,ෆිල්ටර් වර්ග ආදිය) |
| G – 10 | වායු සමීකරණ යන්ත්‍ර සහ එම අමතර කොටස්. |
| G – 11 | ක්‍රීඩා භාණ්ඩ, සුභ සාධන භාණ්ඩ, පාසල් උපකරණ, මුළුතැන්ගෙයි උපකරණ හා ස්වයං රැකියා සඳහා අවශ්‍ය උපකරණ. |
| G – 12 | නිල ඇඳුම්, වැහිකබා, කුඩ, කාර්යාල බෑග් සහ බූට්ස් ආදීය. |
| G – 13 | පෙරදිග සහ අපරදිග සංගීත භාණ්ඩ. |
| G – 14 | පුස්තකාල පොත්, සඟරා, වාර ප්‍රකාශන සහ වෙනත් ප්‍රකාශන. |
| G – 15 | සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපකරණ. |
| G – 16 | වියළි ආහාර ද්‍රව්‍ය. |
| G – 17 | කෘෂි රසායන ද්‍රව්‍ය හා පොහොර (කෘමිනාශක,වල්නාශක සහ රසායනික පොහොර හා කාබනික පොහොර) |
| G – 18 | කෘෂි උපකරණ සැපයීම. (වල් කපන යන්ත්‍ර, වතුර මෝටර් ආදී) |

| | |
|---|---|
| G – 19 | එළවලු සහ පළතුරු පැළ,වනවගාව ආශ්‍රිත පැළ,සුළු අපනයන බෝග පැළ හා බීජ සැපයීම. |
| G – 20 | පශු සම්පත් (එළු,කුකුල්,ගව ආදී) |
| G – 21 | මී මැසි පාලනයට අදාළ මී මැසි ජනපද සහ ඒ ආශ්‍රිත උපකරණ. |
| G – 22 | මිරිදිය ධීවර මත්ස්‍ය සැපයීම. |
| G – 23 | බෙහෙත් ද්‍රව්‍ය,වෛද්‍ය උපකරණ. |
| G – 24 | ධීවර උපකරණ හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය සැපයීම. |

| සංකේත අංකය | සේවා පිළිබඳව විස්තරය |
|---|---|
| S – 01 | අභ්‍යන්තර දුරකතන, පරිගණක යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, CCTV කැමරා සවිකිරීම, මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියාව,වාර සේවා කිරීම සහ එම මෘදුකාංග සැපයීම. (ඇඟිලි සලකුණු වේලා සටහන් යන්ත්‍රද ඇතුළුව.) |
| S – 02 | කාර්යාලීය වානේ උපකරණ හා අනෙකුත් කාර්යාල උපකරණ (විදුලි ලාම්පු, විදුලි උපකරණ) අළුත්වැඩියාව. |
| S – 03 | පවිත්‍රතා සේවා සැපයීම. |
| S – 04 | ආරක්ෂක සේවා සැපයීම. |
| S – 05 | රැස්වීම්, උත්සව සහ වැඩසටහන් සඳහා පිසූ ආහාර, කෙටි ආහාර, තේ පැන් හා දේශන ශාලා පහසුකම්, කාමර පහසුකම් සැපයීම. |
| S – 06 | පරිගණක ජාල ගත කිරීම සහ එම පද්ධතීන් නඩත්තු කිරීම මෙන්ම ස්ථිර, ජංගම දුරකතන පහසුකම් සහ අන්තර්ජාල පහසුකම් සැපයීම සහ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම. |
| S – 07 | වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම් සහ සේවා සිදු කිරීම. |
| S – 08 | සියලුම වර්ගවල වාහන අළුත්වැඩියා කිරීම්. (වායු සමනය කිරීමේ පද්ධතියද ඇතුළුව) |
| S – 09 | සියලුම වර්ගවල වාහන වාර සේවා කටයුතු සිදු කිරීම. (ආයතනය සතු නවීන උපකරණ හා පහසුකම් සඳහන් කරන්න.) |
| S – 10 | එලයිමන්ට් පරීක්ෂා කිරීම සහ වීල් බැලන්සින් කිරීම. |
| S – 11 | වාහන කුෂන් කිරීම, කාපට් කිරීම, ටින්ටඩ් කිරීම, කැනපි ගැසීම සහ අමතර කොටස් සපයා සවිකිරීම. |
| S – 12 | කුළී පදනම මත බස් රථ, වෑන්, ලොරි රථ සහ බැකෝ යන්ත්‍ර ආදීය සැපයීම. |
| S – 13 | ඩිජිටල් මුද්‍රණ කටයුතු, බැනර් සකස් කිරීම, පොත් බැදීමේ කටයුතු, රබර් මුද්‍රා, දින මුද්‍රා, බ්ලොක්, කාර්යාල නාම පුවරු, කාර්යාල හැඳුනුම්පත්, විවිධ ප්‍රතිමා සහ සමරු ඵලක ආදීය සකස් කිරීම සහ සියළුම මුද්‍රණ කටයුතු. |
| S – 14 | තාවකාලික ප්‍රදර්ශන කුටි, කැනපි, උත්සව කටයුතු සඳහා සැරසිලි සහ ශබ්ද වාහිනි යන්ත්‍ර, විදුලි ජනක යන්ත්‍ර කුලී පදනම මත සැපයීම. |
| S – 15 | අභ්‍යන්තර විදුලි පද්ධති අළුත්වැඩියාව, නවීකරණය කිරීම් සහ නඩත්තු කටයුතු සිදු කිරීම. |

S – 16 ගිනි ආරක්ෂණ පද්ධති යාවත්කාලීන කිරීම් සහ අළුත්වැඩියා කිරීම සහ ස්ථාපනය කිරීම.

S – 17 සූර්ය කෝෂ පද්ධති සැපයීම හා අළුත්වැඩියා කිරීම.

S – 18 ජල පෙරණ යන්ත්‍ර අළුත්වැඩියාව.

| සංකේත අංකය | වැඩ පිළිබඳව විස්තරය |
| --- | --- |
| W – 01 | ගොඩනැගිලි ඉදිකිරීම හා අළුත්වැඩියාව. |
| W – 02 | මාහාමාර්ග, පාලම්, බෝක්කු, වාරි මාර්ග, ජල සම්පාදන ඉදිකිරීම හා අළුත්වැඩියාව. |
| W – 03 | විදුලිය තත් ඇදීම් සහ අළුත්වැඩියාව. |
| W – 04 | කුඩා පරිමාණ ඉදිකිරීම් සඳහා නඩත්තු ඒකක ක්‍රියාකිරිම. |
| W – 05 | සියළුම වෙල්ඩින් වැඩ හා ඇලුමිනියම් වැඩ. |

<u>සැපයුම්කරුවකු හෝ කොන්ත්‍රාත්කරුවකු ලෙස ලියාපදිංචි වීමට අවශ්‍ය සුදුසුකම්.</u>

01. සැපයුම් සහ සේවා ලබා දීම සඳහා ව්‍යාපාරය ලියාපදිංචි කර තිබීම ( තනි පුද්ගල ව්‍යාපාරයක් නම් ලියාපදිංචි කිරීමේ සහතිකයද, සමාගමක් නම් සමාගම් පනත අනුව ලියාපදිංචි කිරීමේ සහතිකය) අනිවාර්යය වන අතර, ව්‍යාපාර ලියාපදිංචියේ පිටපතක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

02. ලියාපදිංචිය අපේක්ෂා කරන සෑම කොන්ත්‍රාත්කරුවකුම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) හා ලියාපදිංචි වී තිබීම අනිවාර්යය වන අතර අයදුම්පත්‍රය සමඟ එම ලියාපදිංචි ලේඛනයේ පිටපතක් සහ ව්‍යාපාර ලියාපදිංචියේ පිටපතක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

03. ඇනවුම් කරන ලද භාණ්ඩ අප විසින් දැනුම් දෙන ස්ථානයන් වෙත ප්‍රවාහනය කොට ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයුම්කරු සතු විය යුතු අතර එම භාණ්ඩ ප්‍රමාදයකින් තොරව සැපයුම් කිරීමට හැකිවන පරිදි තොග මට්ටම් පවත්වාගෙන යා යුතුය.

04. සැපයුම් හා සේවා ලබා දීමේදී මුදල් රෙගුලාසිවලට අනුවද, රජය වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස් ප්‍රකාරවද, දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් පනවනු ලබන කොන්දේසිවලට එකඟ විය යුතුය.

05. සැපයුම් කටයුතු සිදු කිරීමේදී අවම වශයෙන් දින 60ක කාල සීමාවකට අදාළ කාර්යාලය වෙත ණය පහසුකම් ලබා දිය යුතු අතර, එම හැකියාව සැපයුම්කරු සතු විය යුතු වේ.

<u>ලියාපදිංචි වීමේ ගාස්තු සහ පරිපාලන වියදම්.</u>

01. සෑම සැපයුම්කරුවෙක් හා කොන්ත්‍රාත්කරුවකුම ලියාපදිංචි වීමට අපේක්ෂිත එක් අයිතමයක් සඳහා රු.1000.00ක ආපසු නොගෙවන තැන්පත් මුදලක් ගෙවිය යුතුය. එම මුදල මොනරාගල දිස්ත්‍රික්කය තුල පිහිටි ඕනෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක හෝ මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත ගෙවීම් කළ හැකිය. මුදල් ගෙවා ලබා ගන්නා ලදුපතෙහි පළමු පිටපත අයදුම්පත්‍රය සමඟ නොගැලවෙන සේ අමුණා එවිය යුතුය.

02. සරප් වෙතින් ලබාගන්නා ලදුපත හැර මුදල් ඇණවුම්, චෙක්පත් හෝ මුද්දර භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවනු නොලැබේ.

සැපයුම්කරුවකු හෝ කොන්ත්‍රාත්කරුවකු ලෙස ලියාපදිංචි වීමට අදාළ වන කොන්දේසි.

01.2024 වර්ෂය තුළ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සාමාන්‍යයෙන් මිල ගණන් කැඳවීම් කරනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවන්හීදි බාහිරව භාණ්ඩ හා සේවා සපයා ගැනීමේ අයිතියද අදාළ කාර්යාලය සතුවන අතර ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සාමාන්‍යයෙන් වර්ෂයක (මාස 12) කාලයක් තුළ වෙනස් නොකර ස්ථාවර තත්ත්වයක තබා ගැනීම කළ යුතුය.

02.විවිධ සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී ප්‍රතික්ෂේප කිරීමට හේතු නොදන්වා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේ අයිතිය මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වේ.

03. ඉල්ලුම් කළ විට අවස්ථා 03 කදී මිල ගණන් ඉදිරිපත් නොකරන්නාවූද, නියමිත ප්‍රමිතීන්ට අනුව ද්‍රව්‍ය හා සේවා සැපයීම හා නියමිත වේලාවට තොග සැපයීමට අපොහොසත් වන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය දැනුම්දීමකින් තොරව අවලංගු කරනු ලැබේ.

04. සපයනු ලබන භාණ්ඩ හා සේවාවන් අදාළ පිරිවිතරයන්ට අනුකූල බවට සනාථ වීමෙන් පසුව පමණක් ගෙවීම් කරනු ලැබේ.

05. S-08 සිට S-11 දක්වා සංකේත අංක යටතේ සේවාවන් සැපයීමේදී,

- ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් සිටිය යුතුය.
- එම කාර්යයට අදාළ යන්ත්‍ර සූත්‍ර ප්‍රමාණවත් පරිදි තිබිය යුතුය.
- ප්‍රමිතගත අමතර කොටස් සැපයීමේ හැකියාව තිබිය යුතුය.
- වාහනවලට ආරක්ෂාව සැලසෙන පරිදි ප්‍රමාණවත් ආවරණ පහසුකම් තිබිය යුතුය.
- රජයේ වාහනවලට ප්‍රමුඛත්වයක් ලබාදිය යුතුය.

06. S-05 සංකේත අංකය යටතේ ලියාපදිංචි වීමේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් නිකුත් කරනු ලබන H-800 වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

අයදුම් කළයුතු පිළිවෙළ

01. මේ සඳහා අයදුම්පත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවිය (www.monaragala.dist.gov.lk) තුලින් ලබා ගත හැකි අතර අයදුම්කරු විසින් පැහැදිලිව අයදුම්පත් සම්පූර්ණ කර එවිය යුතු වේ.

02. සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් විසින් ලියාපදිංචි වන අයිතමයන් සියල්ලට එකවර මුදල් ගෙවීම සිදු කොට ලදුපත ලබා ගත යුතුය. අයදුම් පත 2023.12.15 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ " දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොනරාගල " යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශය වෙත අතින් ගෙනවිත් භාරදීම සිදු කළ හැකි අතර, අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ " 2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම " ලෙස පැහැදිලිව සටහන් කළ යුතුය.

03. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, ප්‍රමාද වී ලැබෙන, අඩුපාඩු සහිත හා අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත සුදුසුකම් නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත්‍ර තැපැලේදී නැතිවීම හා ප්‍රමාද වීම පිළිබඳව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

04. මේ සම්බන්ධව වැඩි විස්තර මෙම කාර්යාලයේ 055 – 2276067 දුරකථන අංකය හරහා ලබා ගත හැකිය.

2023. 11.

ආර්.එම් පසන් එස්.බී. රත්නායක,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
මොණරාගල.